**උද්භිද උද්‍යාන භාර අරමුදල - 2022**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්  සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉදි කෙරෙමින් පවතින ඉඩම් සංවර්ධන ක්‍රියාකාරකම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු. 22,621,698 ක් හා රු. 64,483,040 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.24,974,950 ක් හා රු. 63,991,257 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ඉදි කරමින් පවතින ඉඩම් සංවර්ධන ක්‍රියාකාරකම් රු.2,353,252 ක් වැඩියෙන් හා ඉදි කරමින් පවතින ගොඩනැගිලි රු.491,783 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂයන් හදුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ භූගත විදුලි සැපයීම වෙනුවෙන් ගෙවන ලද රු. 126,265 ක් සමාලෝචිත වර්ෂයේ ඉඩම් සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බැටරි කාර් ආදායම රු.19,038,160 ක් වුවත්, එය රු.19,710,120 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 670,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ මල්වගා පොත් ආදායම රු. 378,575 ක් වුවත්, එය රු.591,315 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 212,740 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව සිහිවටන හා සමරු තිළිණ ආදායම රු. 656,420 ක් වුවත්, එය රු. 574,300 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 82,120 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුල සමරු පිහන් 02 ක් හා කැක්ටස් බඳුන් 195 ක් අලෙවි කර තිබුණද අලෙවි කළ ප්‍රමාණයන් අවසන් තොගයෙන් අඩු කර නොතිබීම හේතුවෙන් අවසන් තොගය රු. 299,928 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවසන් තොගයේ ශේෂය නිවැරදිව දැක්විය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | වටිනාකම (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මෙම අරමුදල වසා දැමීමට කටයුතු නොකර, මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමට කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. | - | ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවායෝජකයන් ගේ භාර අරමුදල් පනත | 2017 හා 2018 වර්ෂවල කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන ඇති සේවකයන් දෙදෙනෙකු සඳහා ගෙවිය යුතු දායක මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | - | කම්කරු දෙපාර්තමේන්තුවෙන් විමසා සුදුසු පරිදි කටයුතු කරන බව. | පනත්වල විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | රාජකීය උද්භිද උද්‍යානයේ වර්ෂ 200 සැමරුමට අදාළ කාර්යයන් 04 ක් සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී මුදල් වැයකර තිබුණි. | 15,002,943 | ප්‍රවේශපත්‍ර ආදායමෙන් සියයට 25 ක් හා වෙනත් ආදායම් මාර්ගවලින් ලැබෙන ආදායම් රැස් කිරීමට, වියදම් කිරීමට හා ආයෝජනය කිරීමට භාර අරමුදල පිහිටුවීමට අදාළ විශ්වාසය පළ කිරීම ඔප්පුව මගින් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා දී ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.100,639,364 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,546,128 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.79,093,236 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවේශපත්‍ර ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල සජීවී ශාකමය බිත්තියක් ඉදි කිරීම සඳහා විද්‍යාත්මක සේවයේ නිලධාරියෙකු විසින් පිළියෙල කර තිබුණු රු. 4,655,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුව සිවිල් ඉංජිනේරුවරයෙකුගේ සහතික කිරීමකින් තොරව ඒ මත පදනම්ව එහි රාමුව සඳහා රු. 1,235,000 ක් හා මල් පෝච්චි සඳහා රු. 3,420,000 ක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතාගේ වාචික උපදෙස් ලබාගෙන ඇති බව. | ගොඩනැගිලි සම්මත රේට විග්‍රහය (BSR) අනුව පිළියෙළ කළ ඇස්තමේන්තු සිවිල් ඉංජිනේරුවරයෙකු විසින් සහතික කළ යුතුය. |
| (ආ) | 2015, 2018, 2021 සහ 2022 වර්ෂවලදී අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා නොගෙන මුද්‍රණය කරන ලද රු. 8,160,594 ක මල් වගා උපදෙස් පොත් 5248 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිශ්කාර්යව පැවතුණි. | කොවිඩ් 19 තත්ත්වය මත සංචාරකයන් අඩුවෙන් පැමිණීම හා රාජකීය උද්භිද උද්‍යානයේ වර්ෂ 200 සැපිරීමට සමගාමීව පැවැත්වීමට නියමිත වූ සමාරම්භක උත්සවය නොපැවැත්වීම හේතුවෙන් අලෙවිය අඩු වී ඇති බව. | අවශ්‍යතාවය මත පොත් මුද්‍රණය කළ යුතුය. |

3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පේරාදෙණිය උද්භිද උද්‍යාන පරිශ්‍රයේ කෞතුකාගාර ආලින්ද 4 ක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 30 දින රු.45,347,264 ක මුදලකට ගිවිසුම්ගතව කොන්ත්‍රාත්කාර ආයතනයට ඉදිකිරීම් පවරා තිබුණි. කොන්ත්‍රාත්තුවට අදාල පිරිවැය ඇස්තමේන්තුවේ වැඩ විෂයන් 46 ක් ඉටුකර නොතිබියදී, ඒ සඳහා රු. 7,175,225 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් කටයුතු අනවශ්‍ය ලෙස ප්‍රමාදවීම වැළැක්වීම සඳහා ගෙවීම් කිරීම අත්‍යාවශ්‍ය බව. | ඉටුකළ වැඩ විෂයයන් සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |